යම් පුවත් වාර්තාවක පුද්ගලයෙකුගේ කුලය සම්බන්ධ විස්තර පුවතට සෘජුවම අදාළ වන්නේ නම් විනා, එසේ නැතිව ප්‍රකාශයට පත් කිරීමෙන් වැළැකිය යුතු බව දෙස් විදෙස් මාධ්‍ය ආචාර ධර්ම මගින් දැක්වේ.

සාමාන්‍යයෙන් පුද්ගලයෙකුගේ කුලය සම්බන්ධයෙන් පුවත් වාර්තාවන්හි පළ වන අවස්ථාවන් අතිශය දුලබ බව කිව හැකියි. නමුත් අපට අවධානය යොමු කළ හැකි කරුණක් වන්නේ, ඇතැම් විටක යම් යම් පුද්ගලයින්ගේ සම්පූර්ණ වාසගම් සහිත නාමයන් පුවත් වාර්තාවන් තුළ ඇතුළත් වීමයි. එසේ සම්පූර්ණ වාසගම් සහිත නාමයන් සඳහන් කෙරෙන්නේ පොලිස් වාර්තා හෝ එවැනි නෛතික ලියවිල්ලක් ඔස්සේ එම නම් ලබාගැනීම නිසා විය හැක.

කෙසේ හෝ, යම් අයෙකුගේ කුලයක් හෝ වෙනත් එවැනි සමාජ බෙදීමක් ඇතැම් විටක දැක්වෙන ලෙසින් පුද්ගලයෙකුගේ වාසගම් සහිත සම්පූර්ණ නාමය පුවත් වාර්තාවන් තුළ සඳහන් වීම පුවත් වාර්තාවකට අදාළ වේ යැයි හෝ අත්‍යාවශ්‍ය වේ යැයි ඔබ සිතන්නේද? සංවාදයට විවෘතයි.
#MediaEthicsSL #lka #SinhalaPress #Aruna #Mawbima